# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/63 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

195(1) වගන්තිය යටතේ නියෝග

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 195 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියේ (අ) ඡේදයේ (vi) වන අයිතමය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මම මෙම නිවේදනය මගින් පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ඇති ඒ වෙනුවෙන් කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති පුද්ගලයින් නිශ්චිතව දක්වනු ලැබේ.

ඩී.එම්.එල්.අයි. දිසානායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය 01**

යම් තැනැත්තෙකු,

01. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සහ වාසිකයෙකු වන;
02. වයස අවුරුදු විසි එක සම්පූර්ණ කර ඇති;
03. පහත සඳහන් මොනයම් හෝ සුදුසුකමක් සපුරා ඇති;

I. දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් තනතුරෙහි හෝ තක්සේරුකරු තනතුරෙහි එකී දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ එකී තනතුරේ අවුරුදු පහකට නොඅඩු සේවයක් ඇත්තා වූ ද; හෝ

II. සමාගම්(විගණන) නියෝග යටතේ විගණකවරයෙකු ලෙස ලියාපදිංචි වී සිටින පුද්ගලයකු නම්; හෝ

III. 11 වන පන්තියේ විගණන අධිකාරී ධූරයට පහළ නොවන ධූරයක ශ්‍රී ලංකා විගණන සේවයෙහි සාමාජිකයෙකුව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබූවා වූ ද පුද්ගලයකු වන්නේ නම්; හෝ

IV. ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගණකාධිකාරී සේවයේ 11 වන පන්තියට පහළ නොවන තත්ත්වයක, රජයේ ගණකාධිකාරී සේවයේ සාමාජිකයෙකුව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබූවා වූ ද පුද්ගලයකු වන්නේ නම්; හෝ

V. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් බඳු උපදේශක; හෝ
VI. සුදුසුකම් සහිත පුද්ගලයෙකු වීමට,

1. පහත සුදුසුකම් අතුරෙන් මොනයම් හෝ සුදුසුකමක් -

(අ) විධායක 1 මට්ටමේ විභාගය/ ගණකාධිකරණය සහ ව්‍යාපාර පිළිබඳ 1 මට්ටමේ සහතිකය / සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී
(ආ) සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ සහතික;
(ඇ) සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය සුදුසුකම් පදනම් මට්ටම;
(ඈ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ කළමනාකරණ මට්ටමේ (03), අන්තර් මට්ටමේ සහතික පත්‍රය;
(ඉ) ගණකාධිකරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ සාමාජිකත්වය දැරීම; සහ

2. සුදුසුකම් ලැබීමෙන් පසුව, ගිණුම් පිළිබඳව යටත් පිරිසෙන් වසර දහයක පළපුරුද්දක් ඇති පුද්ගලයකු වීම (ස්වයං රැකියාවක නියුතු නොවන);

සහ

04. එම තැනැත්තා පහත ආකාරයේ නොවිය යුතුය-

(අ) සිහිවිකල පුද්ගලයෙකු බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ ඇත්නම්; හෝ

(ආ) වස්තු භංගත්වයට පත් වූ පුද්ගලයෙකු හෝ බංකොලොත්වූවකු වශයෙන් තීරණය කරනු ලදුව, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොලොත්භාවය මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් නොවැළැක්විය හැකි අලාභ හෝ ආපදා හේතුවෙන් උද්ගතව ඇති බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් ලබාදී නොමැත්තේ නම්; හෝ

(ඇ) වෘත්තීය විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරුවෙකු වී ඇත්නම්; හෝ

(ඉ) මේ නියෝග යටතේ අනුමත බලයලත් නියෝජිතයෙකු නොවන යම් සේවා යෝජකයෙකු (විගණන සමාගමක් හැර) යටතේ රැකියාවක් භාරගෙන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා බලයලත් නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් කරගෙන යන්නේ නම්;

ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන යම් පුද්ගලයෙකු මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීමට හිමිකම් ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් ඔහු විසින් එම පුද්ගලයා ලියාපදිංචි කොට, ඔහුගේ ලියාපදිංචිය සහතික කොට එම පුද්ගලයාට ලිපියක් නිකුත් කළ යුතුය. යම්හෙයකින් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය සහතිකය ඉවත් කර බලයලත් නියෝජිත ලේඛනයෙන් යම් පුද්ගලයෙකුගේ නම ඉවත් කළ යුතු වන්නේ-

I. තමාගේ නම ඉවත් කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කර ඇත්නම්;

II. මෙම උපලේඛනයේ 4 වන අයිතමය යටතේ ඇති ඕනෑම උප අයිතමයක නිශ්චිතව සඳහන් කර ඇති අශක්නුතා කිසිවකට පාත්‍ර වී ඇත්නම්;

III. ඒ පුද්ගලයා විසින් ඔහුගේ වෘත්තීය තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක්, නොසැලකිලිමත්කමක් හෝ වංකභාවයක් හෝ විෂමාචාරයක් හේතුකොටගෙන, ඒ පුද්ගලයාගේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය අනුමැතිය ඉවත් කොට, ඒ පුද්ගලයාගේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතුය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝග යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති බලයලත් නියෝජිතයන්ගේ ලැයිස්තුවක් යටත් පිරිසෙන් වර්ෂයකට වරක්වත්, ඒ වර්ෂයේ මාර්තු 31 වන දින ඉකුත් වීමට පෙර ගැසට් පත්‍රයේ පළ කරවිය යුතුය.

05 - 186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.